රඹුක්කන ප්‍රාදේශීය සභාව.

කෑගල්ල දිස්ත්‍රික්කය

01. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන2016 මාර්තු 24 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුනි 16 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය.

-----------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට රඹුක්කන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගන්නා ලද රු.299,820 ක් වූ පුස්තකාල පොත් ප්‍රාග්ධනිත නොකිරීම නිසා 2015 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය හා පුස්තකාල පොත් ගිණුමේ ශේෂය රු. 299,820 බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශ තුළින් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයට ලැබිය යුතු උසාවි දඩ මුදල් රු.1,700,292 ක් වුවද එය රු.2,812,501 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා 2015 දෙසැම්බර් 31 දිනට ආදායම් ණයගැතියන්ගේ හා සමුච්චිත අරමුදල් ගිණුමේ වටිනාකම රු.1,112,209 ක් බැගින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබූ රු.6,356,701 ක හිඟ මුද්දර ගාස්තු ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ අප්‍රේල්,ජුනි, ජූලි හා අගෝස්තු මාස වලට අදාලව මුද්දර ගාස්තු උප ලේඛන සකස් කිරීම වෙනුවෙන් කෑගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට ගෙවන ලද රු. 17,600 ක දීමනාව සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස සලකා ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.17,600 ක් අඩුවෙන් පෙන්වා තිබුණි.

(ඉ) මුද්දර ගාස්තු උපලේඛන පිළියෙල කිරීම වෙනුවෙන් කෑගල්ල රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට ඉකුත් වර්ෂයේ මැයි,සැප්තැම්බර්,ඔක්තෝබර්,නොවැම්බර් හා දෙසැම්බර් මාස සඳහා ගෙවිය යුතු රු.25,300 ක් හා සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට මාර්තු දක්වා කාලයට අදාලව ගෙවිය යුතු රු.56,800 ක් ගිණුම්ගත නොකිරීම නිසා වර්ෂයේ අතිරික්තය රු.56,800 කින් හා සමුච්චිත අරමුදලේ ශේෂය රු.25,300 ක් වැඩියෙන් ද 2015 දෙසැම්බර් 31 දිනට ණය හිමියන්ගේ වටිනාකම රු.82,100 ක් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂය සඳහා සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද රු.114,121 ක විගණන ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණ අතර සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(උ) සේවක ඇප රු.44,200 ක් හා සේවක ඇප පොලී රු. 2,051 ක් වැඩිපුර ගිණුම්ගත කිරීම නිසා 2015 දෙසැම්බර් 31 දිනට සේවක ඇප හා සේවක ඇප පොලී එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද සේවක ඇප තැන්පතු වල වටිනාකම රු.46,251 ක් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශන තුළින් දක්වා තිබුණි.

(ඌ) ඉකුත් වර්ෂයේ අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාලව උසාවි දඩ මුදල් උප ලේඛන පිළියෙල කිරීම වෙනුවෙන් සබරගමුව පළාත් සභාවට ගෙවන ලද රු. 12,610 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස සලකා ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.12,610 ක් අඩුවෙන් පෙන්වා තිබුණි.

(එ) විගණිත දිනය වන විටත් ඉටු නොකරන ලද එක් කර්මාන්තයක් සඳහා ඇස්තමේන්තුගත වටිනාකම වන රු.523,000 ක් ණයහිමි ප්‍රතිපාදන සැලසීම නිසා ප්‍රාග්ධන වියදම් හා 2015 දෙසැම්බර් 31 දිනට ණය හිමියන්ගේ වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 <u>නොසැසඳුන පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 07 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.43,922,139 ක් වූ අතර, ඊට අදාල උපයෝගී ලේඛන/ වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.70,933,074 ක් වූයෙන් වෙනස රු. 27,010,935 ක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂ වල වටිනාකම වූ රු. 57,397,453 වූ අතර එයින් රු. 3,869,825 ක් වසරකට වඩා පැරණි විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු. 1,784,395 ක් විය.

1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම්

සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ 2010 නොවැම්බර් 16 දිනැති අංකසීඑම්/ඒඩී/20 දරන චක්‍රලේඛ නියමය පරිදි සෞඛ්‍ය හා මාර්ග කම්කරු තනතුරු වල ස්ථිර පත්වීම් ලද සේවකයන් 5 ක් රියදුරන් ලෙසට ද 2 ක් ආදායම් පරිපාලකවරුන් ලෙසටද පත්වීම් ලිපියේ සඳහන් තනතුරු වලට පරිබාහිරව යොදවාගෙන තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 20,327,341 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු 14,642,635 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය තුල මූල්‍ය ප්‍රතිඵලය රු 5,684,706 ක වැඩි වීමක් පෙන්නුම් කෙරේණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 5,684,706 ක වර්ධනයට ආදායම් විෂයයන් 05 ක වැඩිවීම හා වියදම් විෂයයන් 07 ක අඩු වීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි .

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කල ආදායම්, තථ්‍ය ආදායම් හා සමුච්චිත හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

දිනට හිඟය 2015.12.31

| ආදායම් ප්‍රභවය | 01ජන 201 දිනටහිඟය රු. 000 | 2015දෙසැ 31 දිනට හිඟයෙන් අයකිරීම රු 000 | 2015 වර්ෂයේ බිල් කිරීම් රු 000 | වර්ෂයේබිල් කිරීම්වලින් අයවීම රු 000 | ජන 2015 දිනට 01 පැවති හිඟයෙන රු 000 | වර්ෂයේ බිල් කිරීම් වලින් හිඟය රු 000 | මුළු හිඟය රු 000 |
|---|---|---|---|---|---|---|---|
| (i) වරිපනම් හා බදු | 2,359,445 | 842,055 | 6,113,558 | 5,426,179 | 1,517,390 | 687,380 | 2,204,769 |
| (ii) බදු කුලී | 647,633 | 104,304 | 6,837,879 | 6,629,715 | 543,329 | 208,164 | 751,493 |
| (ii ) බලපත්‍ර ගාස්තු | 709,769 | 697,315 | 3,122,301 | 3,122,301 | 12,454 | - | 12,454 |
| (iv)වෙනත්ආදායම් | 9,943,704 | 7,130,883 | 77,431,266 | 60,965,769 | 2,812,822 | 16,465,497 | 19,278,318 |
| එකතුව | 13,660,550 | 8,774,556 | 93,505,004 | 76,143,963 | 4,885,994 | 17,361,041 | 22,247,035 |

2.3.2 <u>වරිපනම් බදු</u>

වර්ෂ 10 කට වැඩි කාලයක සිට නොගෙවූ රු.106,633 ක් වූ වරිපනම් බදු සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(ආ) වගන්තියේ විධිවිධාන අනුව නීත්‍යානුකූලව පියවර ගෙන නොතිබුණි.

2.3.3 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i) උසාවි දඩ | 2,144,998 |
| (ii) මුද්දර ගාස්තු | 11,143,299 |

2.3.4 <u>ක්‍රීඩාපිටි කුලී</u>

(අ) ක්‍රීඩාපිටි වෙන්කිරීමේදී අත්තිකාරම් මුදලක් ලබා ගැනීමට කටයුතු නොකිරීමෙන් ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රීඩාපිටි තුනක් 2015 වර්ෂයේදී වෙන්කරවා ගත් තැනැත්තන් විසින් නියමිත ගාස්තු නොගෙවීමෙන් අවස්ථා 77 ක් සඳහා රු.136,000 ක මුදලක් සභාවට අහිමිව තිබුණි.

(ආ) ක්‍රීඩාපිටි වෙන්කිරීමේදී සභා තීරණයකින් තොරව සභාපතිවරයාගේ නිර්දේශමත ගාස්තු අයකර නොගැනීමෙන් 2015 වර්ෂයේදී ඔක්තෝබර් 31 දක්වා කාලය තුළදී පමණක් අවස්ථා 07 ක් සඳහා රු. 9,000 ක් සභාවට අහිමිව තිබුණි.

2.3.5 <u>සම්ප්‍රේක්ෂන කුළුණු ගාස්තු</u>

ශ්‍රී ලංකා ජනරජයේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 159/8 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීම සඳහා ඒවායේ උස අනුව සංවර්ධන අවසර පත්‍ර හා පෙරසැරි ගාස්තු අයකළ යුතු වුවත් බල ප්‍රදේශයේ සවිකර තිබු සම්ප්‍රේෂණ කුළුණු 06 ක් සඳහා රු.171,000 ක් අයකර නොතිබුණි.

2.3.6 <u>දැනුවීම් පුවරු ගාස්තු</u>

සභා බල ප්‍රදේශයේ සවිකර ඇති ප්‍රචාරක ආයතන 05ක ස්ථිර දැන්වීම් පුවරු වෙනුවෙන් අයවිය යුතු රු.160,154 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.7 <u>ව්‍යාපාර බදු</u>

සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර පිළිබඳ සමීක්ෂණයක් සිදුකර වෙළඳ බලපත්‍ර ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වුවද 2015 වර්ෂය සඳහා වෙළඳ ආයතන 14 කින් බලපත්‍ර ආදායම් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3 <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදලේ සාමාජිකත්වය දරන සේවකයින් වෙනුවෙන් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවීමේ අවශ්‍යතාවයක් නොමැති වුවත් ප්‍රාදේශීය සභාව සේවකයින් 09 ක් සඳහා සේවක භාරකාර අරමුදලට 2015 වර්ෂයේදී රු.25,707 ක දායක මුදලක් ගෙවා තිබුණි.

3.2 <u>අයවැය පාලනය.</u>

2015 අයවැය ලේඛනය මඟින් වෙන්කර ගන්නා ලද ප්‍රතිපාදන වලින් වැය විෂය 06 ක එකතුව රු.435,000 ක් වූ මුළු ප්‍රතිපාදන මුදලම ඉතිරි කර තිබුණි.

4. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) ගිණුම්කරණය

(ii) ආදායම් පරිපාලනය

(iii) වත්කම් කළමනාකරණය